// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2410/05 - 2024 නොවැම්බර් මස 13 වැනි බදාදා - 2024.11.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/W/2023/179.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන)**
**කාර්මික ආරාවුල් පනත**
4(1) වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල් වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්*

එම්. කේ. ස්ටැන්ලි ගුණරත්න මහතා,
අංක. 310/9,
ක්‍රවුන් සිටි,
හිරිඹුර පාර,
ගාල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්*

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී. එල්. සී.
අංක 242,
යුනියන් පෙදෙස,
කොළඹ 02.

1A - G 043061 - 09 (2024/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද?

අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය ආචාර්ය හරිනි අමරසූරිය වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් කළුතර, නාගොඩ, ශ්‍රී සෝභිත මාවත, අංක 242 හි නීතිඥ ඕබඩගේ ලීලාරත්න මහතා, පත් කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**ආචාර්ය හරිනි අමරසූරිය,**
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍ය.

2024 ඔක්තෝබර් මස 30 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2023/179.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන**
**කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය).**

*එක් පාර්ශ්වයක් වශයෙන්:*

එම්. කේ. ස්ටැන්ලි ගුණරත්න මහතා,
අංක. 310/9,
ක්‍රවුන් සිටි,
හිරිඹුර පාර,
ගාල්ල.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්:*

නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී. එල්. සී.
අංක. 242,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වනුයේ:

"2023.01.31 දින දක්වා නේෂන්ස් ට්‍රස්ට් බැංකුව පී. එල්. සී. සේවය කරන ලද එම්. කේ. ස්ටැන්ලි ගුණරත්න මහතාට 2022 වර්ෂයට හිමි "One off Economic Relief Payment against the Variable Bonus for FY 2022" දීමනාව හා 2022 දෙසැම්බර් හා 2023 ජනවාරි මාසයට හිමි "Economic Relief Allowance" දීමනාව හිමිද යන්නත් හිමි නම් එය ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුවී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදුවී තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳව වේ."

**එච්. කේ. කේ. ඒ. ජයසුන්දර,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2024 ඔක්තෝබර් මස 22 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදි.

EOG 11 - 0081

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.